# ග්ලාස්ගෝ අසිහි පරිමාණය - මේ අයුරින් කරන්න
# GLASGOW COMA SCALE : Do it this way

GCS at 40 | EYES VERBAL MOTOR

ස්නායු විද්‍යා ආයතනය NHS සවිස්තර ග්ලාස්ගෝ චක්‍රය

### පරීක්ෂා කරන්න

අදහස් දැක්වීමට ඇති බාධක.

ප්‍රතිචාර දැක්වීමේ හැකියාව හා අනෙකුත් හානි.

### බලන්න

ඇස් විවර කිරීම.

කථාව තුල අඩංගු දේ සහ දකුනු හා වම් පැතිවල චලනයන්.

### උනන්දු කරවන්න

ශබ්දය : කථාවට හෝ කෑ ගසා කරන ඉල්ලීමට.

කායිකව : ඇඟිලි තුඩු තද කිරීම ත්‍රැපිසියාභ හෝ උපරිඅක්ෂි ගැටය තද කිරීම(ඇසට ඉහලින්).

### ගණනය කරන්න

වැඩිම ක්‍රියාකාරිත්වයට අනුව.

## ඇස් විවර කිරීම

| නිර්නායක | නිරීක්ෂණය | ප්‍රමාණිකය ( ක්‍රියාවට ප්‍රතිචාර) | ලකුණු |
|---|---|---|---|
| අණ දීමට පෙර විවර කරයි. | ✓ | ඉබේම. | 4 |
| කථා කිරීමෙන් හෝ හඬ නගා අණකිරීමෙන් කරන ඉල්ලීම. | ✓ | හඬට. | 3 |
| ඇඟිලි තුඩු තද කිරීම. | ✓ | තද කිරීම. | 2 |
| කිසිසේත් ඇස් විවර නොකරයි. | ✓ | ප්‍රතික්‍රියාවක් නොදක්වයි. | 1 |
| ඇස ආවරණය කර ඇති නිසා පරීක්ෂා කල නොහැක. | ✓ | පරීක්ෂාවට ලක්කළ නොහැක. | NT |

## කථනයට ප්‍රතිචාර

| නිර්නායක | නිරීක්ෂණය | ප්‍රමාණිකය ( ක්‍රියාවට ප්‍රතිචාර) | ලකුණු |
|---|---|---|---|
| නිවැරදි නම,ස්ථානය හා දිනය ප්‍රකාශ කරයි. | ✓ | සාමාන්‍යයි. | 5 |
| කියන දේ නොකලත් කථාව පැහැදිලියි. | ✓ | ව්‍යාකූලයි ( අපැහැදිලියි). | 4 |
| තේරුමක් නැති තනිවචන කියයි. | ✓ | වචන. | 3 |
| කෙඳිරිගෑම හෝ ගෙරවීම. | ✓ | ශබ්ද. | 2 |
| ඇසුනු බවක් නොහඟවයි. | ✓ | ප්‍රතික්‍රියාවක් නොදක්වයි. | 1 |
| සන්නිවේදනයට බාධා නිසා පරීක්ෂා කල නොහැක. | ✓ | පරීක්ෂාවට ලක්කළ නොහැක. | NT |

## ප්‍රසස්ථ (උපරිම) චලන ප්‍රතිචාර

| නිර්නායක | නිරීක්ෂණය | ප්‍රමාණිකය ( ක්‍රියාවට ප්‍රතිචාර) | ලකුණු |
|---|---|---|---|
| එකවර කරන අණකිරීම් දෙකකට නිවැරදිව ප්‍රතිචාර දක්වයි. | ✓ | අණ ඉටු කරයි. | 6 |
| හිසට හා බෙල්ලට ලබාදෙන උත්තේජනයට,කරට ඉහලින් අත ගෙන ඒම. | ✓ | අත නැමීම සාමාන්‍යයි. | 5 |
| වේගයෙන් අත වැළමිටෙන් නවයි,එහි වෙනසක් නැත (සාමාන්‍යයි). | ✓ | නැමීම සාමාන්‍යයි. | 4 |
| අත වැළමිටෙන් නවයි, එහි කැපී පෙනෙන වෙනසක් පෙනෙන අතර සාමාන්‍යය නොවේ. | ✓ | අත නැමීම සාමාන්‍යය නොවේ. | 3 |
| අත වැළමිට ලඟින් දිගහරියි. | ✓ | දිගහැරීම කරයි. | 2 |
| අත් පා නොසොලවයි. | ✓ | ප්‍රතික්‍රියාවක් නොදක්වයි. | 1 |
| වෙනත් බාධාවක් නිසා හෝ අප්‍රාණික නිසා පරීක්ෂා කල නොහැක. | ✓ | පරීක්ෂාවට ලක්කළ නොහැක. | NT |

## කායික උත්තේජනය සඳහා

ඇඟිලි තුඩු පීඩනය.



ත්‍රැපිසියාභ තෙරපීම.



උපරි අක්ෂි ගැටය තෙරපීම.



## සම්මිංජන(නැවීමේ)ප්‍රතිචාර ලක්ෂණ

Van Der Naalt 2004 අවසරයට අනුව නවීකරණය කරන ලදි.

**අසාමාන්‍ය නැමීම**

සෙමෙන් තමාටම පුරුදු ඒකාකාරී ලෙස අත පපුව හරහා නමයි.

පූර්ව භාහුව භ්‍රමණය(කරකවයි) කරයි.

මහපට ඇඟිල්ල හකුළුවයි.

පාදය දිග හරියි.



**සාමාන්‍ය නැමීම**

නැමීම වේගවත්ය.

විවිධාකාරයි(විචල්‍යයයි).

අත ශරීරයෙන් ඉවතට ගෙන යයි.

වැඩි විස්තර සඳහා සහ රූපරාමු දැක්විම සඳහා පිවිසෙන්න.: www.glasgowcomascale.org

Graphic design by Margaret Frej based on layout and illustrations from Medical Illustration M I • 268093